සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security – Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/LH/4/Revolving Fund
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2020.02.20

සමෘද්ධි චක්‍රලේඛ අංක 2020/6

දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්/නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන්,

සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන -2020**
**ආර්ථික සවිබලගැන්වීමේ ව්‍යාපෘති සඳහා ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන මඟින් සහන ණය ලබා දීමේ නව සංශෝධන ක්‍රියාත්මක කිරීම**

**සෞභාග්‍යයේ දැක්ම යථාර්තයක් බවට පත් කරමින් , දිළිඳු බවෙන් තොර සමෘද්ධිමත් දේශයක් ගොඩනැංවීම ඉලක්ක කර ගත් දිශානතියනට සුදුසු වැඩසටහන් මෙහෙයවීම අප සැමගේ යුතුකමක් සේම වගකීමක් ද වනු ඇත.**

02. දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකිරිම උදෙසා භාණ්ඩාගාර ප්‍රතිපාදනවලට අමතරව , ජීවනෝපාය චක්‍රිය ණය වැඩසටහන සහාය කර ගනිමින් , ග්‍රාමීය හා නාගරික ප්‍රජාවගේ දායකත්වය සහිතව ජනතා කේන්ද්‍රීය ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් ගොඩනැංවීමෙහිලා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහාය ලබා දීමට වැඩසටහන් සැලසුම් කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව පෙන්වා දෙමි.

03. ග්‍රාමීය හා නාගරික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතිලාභීන් ආසන්නතම ගිනි පොලීකරුවන්ගේ ග්‍රහනයට හසුවී , ණය බරෙන් පීඩිතව අසරණ වී තම ව්‍යාපෘති අත්හැර දැමීමෙන් ජාතික ආදායමට ඔවුන් ලබා දුන් දෙන දායකත්වය ක්‍රමයෙන් ගිලිහී යන බවක් දක්නට ඇති බැවින් , 2020 වර්ෂයේ ජීවනෝපාය ක්ෂේත්‍රයේ ව්‍යාපෘතිවල නියැලී සිටින හා නියැලීමට අපේක්ෂිත සමෘද්ධි ප්‍රතිලාභින් / අඩු ආදායම්ලාභීන් සඳහා ජීවනෝපාය චක්‍රිය ණය වැඩසටහන හරහා සහන ණය ලබා දීම තවදුරටත් කාර්යක්ෂම ලෙස ඉහළ නැංවීමට මේවනවිට කටයුතු සැලසුම් කර ඇත.

04. මේ සඳහා කඩිනමින් ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වන බැවින් මෙම ව්‍යාපෘතිලාභීන් සඳහා ක්ෂණික මූල්‍ය අවශ්‍යතාවයන් සම්පාදනය කර දීම තුළින් ඔවුන් තවදුරටත් නිෂ්පාදන ක්‍රියාවලියේ රඳවා තබා ගැනීමට

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන බෙහෙවින් ඉවහල් වනු ඇත. ඒ අනුව මේ තුලින් සහන ණය ලබා දීමේ ක්‍රියාවලිය තවදුරටත් නම්‍යශීලී බවට පත් කිරීමට මේ වනවිටත් අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව සතුටින් දන්වමි.

05. ඒ අනුව දේශීය ආර්ථිකය ගොඩනැංවිමෙහිලා ජීවනෝපාය ව්‍යාපෘති කෙරෙහි ප්‍රජාව ආකර්ශණය කර ගැනීමෙන්, ජාතික ආර්ථිකයට ඔවුන් ලබා දෙන දායකත්වය ඉහළ නංවාලීමට පහත සඳහන් පරිදි නව සංශෝධනයන්ට යටත්ව ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන මඟින් ව්‍යාපෘති / වැඩසටහන් සඳහා සහන ණය ලබා දීමට කටයුතු කල යුතු බව පෙන්වා දෙමි.

- ❖ දැනට ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන මඟින් ජීවනෝපාය ව්‍යාපෘති සඳහා ණය ලබා දීමේදී බලපවත්වන 12% ක් වූ වාර්ෂික පොලී ප්‍රතිශතය 5% දක්වා පහත හෙලීමට කටයුතු කර ඇත.(හීනවන ශේෂ ක්‍රමයට පොලිය ගණනය කල යුතුයි.)
- ❖ මෙහිදී අදාළ පොලී ප්‍රතිශතයෙන් 2% ක් බැංකුවේ ණය පොලී ආදායම් ගිණුමටද ඉතිරි 3% ජීවනෝපාය සංවර්ධන චක්‍රීය ණය අරමුදල සඳහාද බැර කල යුතු වේ.
- ❖ එසේම දැනට බලපවත්වන රු.1,000,000/- ක් වන උපරිම ණය මුදල් සීමාව ව්‍යාපෘතිලාභීන්ගේ ක්ෂණික ව්‍යාපෘති මූල්‍ය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා රු.100,000/- ක උපරිමයක් දක්වා පහත හෙලීමට කටයුතු කල යුතු වේ.

06. පහත සඳහන් ව්‍යාපෘති / වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම සහන ණය ලබා දීමට කටයුතු කල හැකි වේ.

I. ව්‍යවසායන් ප්‍රවර්ධනය තුලින් වැඩි ඍජු හා වක්‍ර රැකියා ප්‍රමාණයක් උත්පාදනය වන්නේ නම් , එවැනි ව්‍යාපෘති/ව්‍යවසායන් හී ණය අවශ්‍යතා සපුරාලීම

II. නව ව්‍යාපෘති බලගැන්වීම හා නව නිෂ්පාදන තුලින් නිපදවන භාණ්ඩ දේශීය හා විදේශීය වෙළඳපලට යොමු කිරීම සඳහා වූ සහන ණය

III. පවත්නා ව්‍යාපෘති ඉහළ මට්ටමක් කරා රැගෙන යාමට අවශ්‍ය සංවර්ධන මූල්‍ය සහන ණය පහසුකම් සැපයීම

IV. පෞද්ගලික අංශයේ ව්‍යවසායන් සමඟ සමෘද්ධි ව්‍යවසායකයින්ට පෙර ගිවිසුම් මත පදනම්ව ව්‍යාපෘති ආරම්භ කිරීමට අවශ්‍ය සහන ණය ලබා දීම

V. ජීවනෝපාය ව්‍යාපෘතියක් සඳහා නව තාක්ෂණය යොදා ගැනීම හා අවශ්‍ය වූ යටිතල පහසුකම් ලබා කර දීම සඳහා වූ සහන ණය

VI. ගමේ පවත්නා විශේෂ සම්පත් උපයෝගී කරගනිමින් , පරිසර හිතකාමී නිෂ්පාදන ඇති කිරීමත් කෘෂි අගයදාම ව්‍යාපෘති ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය උපකරණ හා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට අවශ්‍ය සහන ණය ලබා දීම

VII. නව තරුණ ව්‍යවසායකයින් සඳහා මූලික පියවරේදී පහසු ඇප සුරැකුම් මත සහන ණය පහසුකම් සැපයීම

**07. පොදු උපදෙස්**

i. සහන ණය ලබාදීමේදී , සවිබලගැන්විය හැකි සමෘද්ධි පවුල් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ණය ලබා ගැනීමෙන් අනතුරුව පවත්නා හෝ ආරම්භ කල ව්‍යාපෘති තුළින් අදාළ ව්‍යාපෘතිලාභියාගේ ආදායම ඉහළ මට්ටමකට රැගෙන යාම අවශ්‍ය වන අතර, ඒ බව තහවුරු කර ගත හැකි වන පරිදි වාර්තා පවත්වා ගැනිමද අවශ්‍ය වේ.

ii. වර්ෂ අවසානයේ තොරතුරු ලබා දීමට හැකිවන පරිදි , සහන ණය ලබා ගත් ව්‍යාපෘතියේ විස්තර සහිතව ( ආදායම ඉහළ යාමද ඇතුළුව ) ණයලාභීන්ගේ නාම ලේඛණය නිවැරදිව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ.

iii. සවිබලගැන්වීය හැකි පවුල් විසින් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ආදායම් තත්ත්වය තවදුරටත් ඉහළට ගෙනයාමට අවශ්‍ය වන ,යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනිම සඳහා සහන ණය පහසුකම් ලබා දීමට කටයුතු කරන්නේ නම් , අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා චක්‍රලේඛවල සඳහන් උපදෙස් අනුගමනය කල යුතුය.

iv. සහන ණය ලබාදීමට පෙර අදාළ සමෘද්ධි සංවර්ධන නිලධාරී, ව්‍යාපෘති කළමණාකරු, සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරු මෙම ව්‍යාපෘතිවල ඇති ශක්‍යතාවය සම්බන්ධයෙන් සෑහිමකට පත්වීම අත්‍යවශ්‍ය වන අතරම ණය ලබාදීමෙන් අනතුරුවද පසු විපරම අනිවාර්යවේ.

v. සහන ණය ලබාදීමේදී පෙර ණය පැහැර හැරීම් / ගිවිසුම් කඩ කිරීම හා වෙනත් අයුරකින් විශ්වාසය කඩ කිරීම් සිදු කර ඇත්ද යන්න පිළිබඳව විමසා බැලීම අවශ්‍ය වන අතර එවැනි සාමාජිකයින්ට ණය ලබා දීම නොකල යුතුය.

vi. සෑම සහන ණය මුදලක්ම සමෘද්ධි ප්‍රජාමූල බැංකු ණය ක්‍රමවේදයන්ට අනුගත වෙමින් ලබාදීම අවශ්‍ය වන අතර අවශ්‍ය නිර්දේශයන් හා අනුමැතියද ඒපරිද්දෙන්ම ලබා ගත යුතුය.

vii. මෙහිදී ලබා දුන් සහන ණය අයකර ගැනීමේ අවධානම ප්‍රධාන වශයෙන් සමෘද්ධි ප්‍රජාමූල බැංකුව විසින් දැරිය යුතු වන නිසා අදාළ සෑම සමෘද්ධි නිලධාරීයෙකුගේම කැපවීම හා දායකත්වය විශේෂයෙන් වැදගත් වේ.

viii. තවද පුද්ගල ආර්ථික සංවර්ධනයට මෙන්ම රටේ සංවර්ධනයට බෙහෙවින් ඉවහල්වූ , එහෙත් විවිධ හේතු නිසා ණය ගලා නොයන සුවිශේෂී සුළු පරිමාණ ව්‍යාපෘතීන් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

ix. මීට පෙර ලබා දී ඇති උපදෙස් අනුව, නියමිත දිනට නිවැරදිව, අදාළ ආකෘති පත්‍රවලට අනුව ප්‍රගතිය ලබා දීමට කටයුතු කල යුතුයි.

x. මෙම චක්‍රලේඛ උපදෙස් මත ජීවනෝපාය චක්‍රීය ණය මුදල් දීමේදී, දැනටමත් සමෘද්ධි බැංකුව මඟින් ක්‍රියාත්මක වෙනත් ණය යෝජනා ක්‍රම මඟින් හෝ බාහිර ආයතන/පාර්ශව මඟින් ලබාගෙන තවදුරටත් ගෙවීමට ඇති ණය මුදල් පිළිබඳව මෙන්ම ,මෙහිදී ලබා ගැනීමට අපේක්ෂිත ණය මුදල් ආපසු ගෙවීමට ඇති හැකියාව පිළිබඳවද සොයා බලා සහන ණය මුදා හැරිම සිදු කල යුතුය.

xi. ජීවනෝපාය චක්‍රීය වැඩසටහන මඟින් සහන ණය නිකුත් කිරීමේදී ක්ෂුද්‍ර මූල්‍ය අංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ හා ඊට අදාළ එකතුන් හි උපදෙස් ද තවදුරටත් වලංගු කර ගැනීමට කටයුතු කල යුතුය.

xii. ඉහත නව සංශෝධනයන් මෙම චක්‍රලේඛය නිකුත් කල දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

මෙම වැඩසටහන තුළින් ආර්ථික හා සාමාජීයව සවිබලගැන්වූ සමෘද්ධිමත් ප්‍රජාවක් ගොඩ නංවමින් දරිද්‍රතාවය තුරන් කිරීමට ඔබ දක්වන සහාය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්-

1. ලේකම්, කාන්තා,ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ගැ. පි.
2. රාජ්‍ය ලේකම් , සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ. පි.
3. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.
6. සියළුම අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.
7. සියළුම සභාපතිවරු, සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.
8. සියළුම සභාපතිවරු, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.